# 19. ගෘහ ආර්ථික විද්‍යාව

**ගෘහ ආර්ථික විද්‍යාව -10 ශ්‍රේණිය**

**02 පාඩම පැවරුම :- නිවසක් ගොඩනැගීම සඳහා භූමියක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු**

(1) නිවසක් ගොඩනැගීමට භූමියක් තෝරා ගැනීමේදී සැලකිය යුතු මූලික කරුණු 05 දක්වන්න.

(2) හොඳ භූමියක ස්වභාවය කෙබඳුද? පැහැදිලි කරන්න.

(3) ඔබ තෝරා ගන්නා භූමියේ ඔප්පුවේ නිරවුල් බව තහවුරු කර ගන්නේ කෙසේද?

(4) යටිතල පහසුකම් ලෙස ඔබ විශේෂයෙන් සලකා බලන කරුණු පහක් ලියන්න.

(5) නිවසක් ඉදි කිරීමට භූමියක් තෝරා ගැනීමේදී අප අවට පරිසරය පිළිබඳවද අනිවාර්යයෙන්ම සලකා බලයි.හොඳ පරිසරයක දක්නට ලැබෙන ලක්ෂණ පහක් දක්වන්න.

**03 පාඩම පැවරුම :- නිවසක් සැලසුම් කිරීමේදී සැලකිය යුතු කරුණු**

(1) නිවසක් සැලසුම් කිරීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු පහක් දක්වන්න.

(2) භූමිය ගැන අවධානය යොමු කිරීමේදී වඩාත් යෝග්‍ය වන්නේ කුමන හැඩයේ භූමියක්ද?

(3) නිවසක සැලසුමක් ඇඳීමේදී අවධානය යොමු කල යුතු ප්‍රධාන කරුණු 07 ක් දක්වන්න.

(4) වහලේ බර දරා සිටින බිත්තියක ඝණකම කොපමණ තිබිය යුතුද?

(5) නිවසක ප්‍රධාන නිදන කාමරයෙහි විශාලත්වය අවම වශයෙන් කොපමණ විය යුතුද?

(6) "රාශිකරණය" යන්න හඳුන්වා එය උදාහරණයක් මඟින් විස්තර කරන්න.

**04 පාඩම පැවරුම :- නිවස සංවිධානය කිරීම**

(1) නිවසක් සංවිධානය කිරීමේදි විශේෂ අවධානය යොමු කල යුතු කරුණු 04 ක් නම් කරන්න.

(2) ගෘහ කයර්යන් එකිනෙකට සම්බන්ධ වන ආකාරයට කාමර පිහිටුවන අයුරු පහදන්න.

(3) නිදන කාමරයක දොර පිහිටුවන්නේ කෙසේද?

(4) නිදන කාමරයක ජනෙල් පියන් සඳහා වඩාත් සුදුසු වන්නේ කුමන වීදුරුද?

(5) "බහු කායර් ඒකක" පිළිබඳ කෙටි විස්තරයක් උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.

(6) "බහු කායර් භාණ්ඩ" දෙකක් නම් කරන්න.

(7) නිවසක "ඉඩකඩ පිරිමසින ගෘහ භාණ්ඩ" පහක් නම් කරන්න.

(8) නිවස සංවිධානයේදී නිවස අලංකාර කිරිම සඳහා භාවිතා කරන "උපාංග" පහක් නම් කරන්න.